# 13 පාඩම - වාක්‍ය රචනය

# 7 ශ්‍රේණිය

බප/හො/උඩුවර කනිටු විදුහල.

නිශ්චිත මාතෘකාවක් යටතේ, ඊට අදාළ කරුණු හා හැඟීම් ක්‍රමවත්ව, සංවිධානාත්මකව,නිර්මාණාත්මකව ලියන බසින් ඉදිරිපත් කිරීම වාක්‍ය රචනය වේ.

<u>වාක්‍ය රචනයක ආකෘතිය.</u>

01 . ප්‍රවේශය හෙවත් ආරම්භය.

02 තර්කානුකූල විෂය කරුණු.

03 . සමාලෝචනය හෙවත් අවසානය.

## රචනා සැකිල්ල

- වාක්‍ය රචනය ලිවීම සඳහා සකස් කර ගන්නා දළ සැකිල්ල.

# වැඩිහිටියන් රැක බලා ගනිමු

- වැඩිහිටියන් යනු අපට වඩා කාලයකට පෙර ඉපදී, අපට වඩා කාලයක් මේ ලෝකයේ ජීවත් වූ, බොහෝ අත්දැකීම් හා දැනුම් සම්භාරයක් සහිත වැදගත් පුද්ගලයෝ වෙති. බොහෝ වැඩිහිටියෝ තමාගේ තරුණ කාලයේ සිට සමාජයට යුතුකම් නොපිරිහෙලා ඉටු කළ අය වෙති.

- සමාජය වැඩිහිටියන්ව ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස හදුන්වයි. වැඩිහිටියන්ගෙන් සමාජයට සිදුවන සේවාව කියා නිම කළ නොහැක. ඔවුහු අපව ආරක්ෂා කර ගැනීම සඳහා නිරන්තරයෙන්ම සැදී පැහැදී සිටිති. පාරම්පරික දැනුම, සිරිත් විරිත්, සම්ප්‍රදායන් ආදිය ඊළඟ පරම්පරාව වෙත දායාද කරන්නේ වැඩිහිටියෝය. වැඩිහිටියන් විසින් අපහට යම් උපදෙසක් දෙනු ලබන්නේ ද , එම උපදෙස තුළ අප ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු ගුණ ධර්ම පිරී තිබේ. මේ ආදි බොහෝ කරුණුවලින් වැඩිහිටියන්ගේ අගය අපට තහවුරු කළ හැකිය.

- වර්තමාන පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනි මාධ්‍ය වලින වැඩිහිටියන්ගේ ගෞරවය විනාශ වන ආකාරයේ පුවත් හමුවේ. ඒ ඇතැම් පුද්ගලයින් තම වැඩිහිටියන් වෙනුවෙන් කළ යුතු යුතුකම් කඩ කිරීමේ ඛේදනීය අවස්ථාවන්ය. පොදුවේ ගත්විට වර්තමාන සමාජය වැඩිහිටියන්ට සලකන ආකාරය බොහෝ අශෝභනය. ඒ නිසාම දිනෙන් දින බිහිවන වැඩිහිටි නිවාස ප්‍රමාණය අති විශාලය. බොහෝ උගතුන් ධනවතුන්ගේ වැඩිහිටියන් ද මේවා තුළ වාසය කරන බව නොරහසකි.

- වැඩිහිටියන් රැක බලා ගැනීමට නම් ඔවුන් සමඟ සාමකාමීව ජීවත් විය යුතුය. ඔවුන් සමග වාදවිවාද වලට පැටලීම සුදුසු නොවේ. වැඩිහිටියන්ගේ වරදක් දුටුවොත් ඔහු හෝ ඇය සමඟ වාදයට නොගොස් ඉවසීමෙන් කටයුතු කළ යුතුය. එසේම වැඩිහිටියන්ට ලෙඩක් දුකක් සෑදුන විට ඔහු හෝ ඇය අසල සිට අවශ්‍ය ඖෂධ ලබා දී හොදින් සැළකිය යුතුය.
- රජය යටතේ වැඩිහිටියන් රැක බලා ගැනීම පිළිබඳ බොහෝ ක්‍රියා මාර්ග ගත හැකිය. වැඩිහිටියන් වෙනුවෙන් සෑම වසරක ම ඔක්තෝබර් 01 වන දින ලෝක වැඩිහිටි දිනය ලෙස නම් කර තිබේ. රජය යටතේ වැඩිහිටියන් රැක බලා ගැනීම පිළිබඳ නව නීති රීති හදුන්වා දීම සහ රජය යටතේ වැඩිහිටියන් රැක බලා ගැනීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ඒ අතර ඇති වැදගත් ක්‍රියා මාර්ග වේ.
- කෙළෙහි ගුණ දත් දැහැමි සමාජයක යුතුකම වන්නේ තම වැඩිහිටි පුරවැසියන් රැක බලා ගෙන ඔවුනට හිමි ගෞරවය ලබා දීමයි. එම ජාතික යුතුකම ඉටු කිරීමට අපි ඇප කැප වෙමු.

මෙම රචනයේ සැකිල්ල මෙසේය.

01 වැඩිහිටියන් යනු කවුරුන් ද?

02 වැඩිහිටියන් රැක බලා ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුවීම.

03 වැඩිහිටියන්ගේ අගය, ඔවුන් සමාජයට සම්පතක් බව.

04 වැඩිහිටියන් රැක බලා ගැනීම උදෙසා නිවස තුළ සිදු කළ යුතු කාර්යයන්.

05 රජය ගත යුතු ක්‍රියා මාර්ග.

නිර්මාණාත්මකව වාක්‍ය රචනය ලිවීම වැදගත් ය. ඒ සඳහා අලංකාරවත් බස් වහරක් (උපමා රූපක විශේෂණ පද)යොදා ගත යුතුයි.

## රචනයක් ලිවීමේදි අනුගමනය කළ යුතු ශිල්පීය දක්ෂතා

- නිවැරදි ලිඛිත භාෂාව භාවිතා කිරීම.
- කරුණු  ජේද වශයෙන් ඉදිරිපත් කිරීම.
- උක්තාඛ්‍යාත සම්බන්ධය නිවැරදි වීම.
- නිවැරදි විරාම ලක්ෂණ භාවිතය.
- නිවැරදි අක්ෂර වින්‍යාසය .

නිර්මාණාත්මක රචනයක ආරම්භයට නිදසුනකි.

## පියකරු උදයක්

මෙතෙක් වේලා සැඟව සිටි හිරු කුමරු කඳු අතරින් එබී බලා, තම නෙත් කැලුම් මිහිතලය මතට යොමු කරයි.ඒ නෙත් කැල්මෙන් වශී වූ මල් කුමරියෝ පෙති එකිනෙක විහිදුවති. පෙති විහිදුවත් ම ඔවුන් වෙතින් හමනා අපූරු සුගන්ධය පරිසරය පුරා ම පැතිරී යයි.ඒ සුවඳ උරා ගන්නා සීතල මදනල හමා යන්නේ අපේ ගතත් සිතත් පුබුදුවමිනි.

මෙතෙක් සීතලට නිදා හුන් සියොත් කැල, හිරු කුමරුගේ උණුසුමින් නිදි ගැට හැර පියා අවදි වෙති. අවදි වී තමන්ගේ මිහිරි සංගීත රාවය පරිසරය පුරා පතුරුවා හරින්නේ අපගේ දෙසවන් පිනවමිනි. මෙතෙක් යහනේ නිදි දෙව් දුවට තුරුල් වී නිදාවුන් ළමා ළපටි ලහිලහියේ පිබිදෙති. පිබිදි හනි හනික මුව දොවා, අහර ගෙන දෙමාපිය පා නැමද පාසල් යෑමට සූදානම් වෙති. සුදු වතින් සැරසී , පොත් මිටියත් තුරුල් කර, ඔවුන් වෙල් නියර දිගේ පාසල වෙත පිය නගන්නේ සුදු කිරි කොක් රෑනක් සේය.

ලිඛිත අභ්‍යාස

01. සඳ පහන් රැයල ඉර බැස යන සැඳෑවක වෙල් යායක ගත කළ මොහොතක් ල මෙයින් ඔබ කැමති මාතෘකාව යටතේ කෙටි වැකි යොදමින් නිර්මාණාත්මක රචනයක් ලියන්න

02. පහත සඳහන් මාතෘකා සඳහා රචනා සැකිල්ල බැගින් ලියන්න.

- 1. ජල සම්පත සුරකිමු.
- 2. මම ගංගාවක් වෙමි.
- 3. රූපවාහිනියෙන් නිසි ප්‍රයෝජන ගනිමි.

03.ඔබ කැමති මාතෘකාවක් යටතේ රචනා සැකිල්ල පිළියෙල කර ඒ යටතේ වචන 200 ක පමණ රචනයක් ලියන්න.

- 1.දහම් පාසල් අධ්‍යාපනයේ අගය.
- 2. තුරුලතා රැක ගනිමු
- 3. ගැමි දිවියේ මිහිර
- 4.උගත මනා ශිල්පයමයි මතු රැකෙනා